**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**මහ සභා රැස්වීම.**
**2022.02.17**

**සහභාගි වූ සභික නාමාවලිය :-**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ජී. අනෝමා රෝෂිණී නිලන්ති මෙනවිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. ඥානතිලක මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රසිරි මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා

**සහභාගි නොවූ සභික නාමාවලිය :-**
**නැත.**

**සහභාගි වූ නිලධාරින් :-**

01.ලේකම් (වැ.බ) - එච්.එල්.ප්‍රේමදාස මයා.

02.සංවර්ධන නිලධාරී - ඩී.කේ.නිසංසලා මිය.

**<u>ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022.02.17 දින පැවති මහ සභා රැස්වීමේ සංෂිප්ත වාර්තාවයි.</u>**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස මහ සභා රැස්වීම ආරම්භ කිරීම සඳහා 2022.02.17 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්නා ලදි. ආගමික වතාවත් සිදු කිරීමෙන් හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමාත් ගරු සභික මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්,පිළිගැනීමෙන් අනතුරුව, න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

**01.පසුගිය මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

❖ 2022.01.20 වන දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

<u>ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා</u>
ගරු මන්ත්‍රීතුමනි, 2022.01.20 වෙනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>
මෙම සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>
එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස 20 වැනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමාගේ නිවේදන.**

- **ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිටියදී 2022.02.01 දින හදිසි අනතුරකින් මිය ගිය එච්.පී.නිශාන්ත ගුණවර්ධන මහතාගේ අභාවය පිළිබඳ සංවේගය ප්‍රකාශ කිරීම.**

<u>ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිටි නිශාන්ත ගුණවර්ධන මහතා පසුගිය දිනක හදිසියේ අභාවප්‍රාප්ත වුණා.එතුමා බොහොම හොඳ සේවකයෙක්.සියළු දෙනාගේ ආදරය දිනා ගත්ත කෙනෙක්.ඔහුගේ අභාවය සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රී මණ්ඩලයේත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේත් සංවේගය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.ඒ වගේම එතුමාට අජරාමර නිවන් සුව අත්වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

- **ජාතික විගණන කාර්යාලය විසින් යොමු කරන ලද අංක RAT/F/EMPS/AQ/2021/04 දරණ මූල්‍ය හා කාරියසාධන විගණනය - 2021**
- **පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් යොමු කරන ලද ACLG 09/01/02/01 අංක දරණ 2021 පෙබරවාරි මස අධීක්ෂණ වාර්තාව.**

**03. සංදේශ/පෙත්සම්/පැමිණිලි ඉදිරිපත් කිරිම.**
**නැත.**

**04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ.**
**නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05.01) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂය සඳහා සකස් කරන ලද අවසාන ගිණුම් වාර්තාව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද අවසාන ගිණුම් වාර්තාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද අවසාන ගිණුම් වාර්තාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.02) 2021 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

2021.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ, සමීක්ෂණ මණ්ඩල විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරිම සඳහා අනුමැතිය ලබා දීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

(මෙහිදී ගරු සභාපතිතුමා විසින් 2021 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල විසින් ලබාදෙන ලද භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ සභාගත කරන ලදි.)

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

ගරු සභාපතිතුමණි,මට නම් පේන්නේ සමීක්ෂණ මණ්ඩලයට අදාල ඒවයි නැති ඒවයි දෙකම නිර්දේශ කරල වගේ.ඕකේ ක්‍රියාත්මක කරන්න අත්‍යාවශ්‍ය ටිකක් ඇති.ඒ ටික ක්‍රියාත්මක නොවුණොත් තමයි ගැටළුව වෙන්නේ.ඒ ටික ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අවධානය යොමු කරන්න.

- **ඒ අනුව,ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අදාලව සමීක්ෂණ මණ්ඩල විසින් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.03) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතුව සිටියදී 2022.02.01 දින හදිසි අනතුරකින් මිය ගිය එච්.පී.නිශාන්ත ගුණවර්ධන මහතාට,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 176 වන උප වගන්තිය අනුව පාරිතෝෂික දීමනාවක් ගෙවීම සඳහා තීරණයක් ලබා ගැනීමට හා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මෙම ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතුව සිටියදී 2022.02.01 දින හදිසි අනතුරකින් මිය ගිය එච්.පී.නිශාන්ත ගුණවර්ධන මහතාට, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 176 වන උප වගන්තිය අනුව පාරිතෝෂික දීමනාවක් ගෙවීමට හැකියාවක් තිබෙනවා.විශේෂයෙන් ඔහු ස්ථිර සේවකයෙක් නොවන නිසා ඔහුට විශ්‍රාම වැටුපක් ලැබෙන්නෙත් නැහැ.කුඩා දරුවන් දෙදෙනෙක් සිටින නිසා මෙවැනි දීමනාවක් ගෙවීමට හැකිනම් එය ඉතා වටිනවා.මේ සඳහා සුදුසු මුදල සභාව විසින් තීරණය කළ යුතුයි.මේ සම්බන්ධව තීරණයක් ලබා ගැනීමට හා අනුමැතිය ලබා දීම සුදුසුයි බවට මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා. නිශාන්ත ගුණවර්ධන මහතා සභාවට අවංකවම සේවය කරපු කෙනෙක්.ඔහු වෙනුවෙන් අපට කළ හැක්කේ මෙපමණයි.ඒ වෙනුවෙන් ගෙවන මුදල අපි තීරණය කළ යුතුයි.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
මම යෝජනා කරනවා, නිශාන්ත ගුණවර්ධන මහතාට පාරිතෝෂික දීමනාව වශයෙන් රු:300,000.00ක මුදලක් ගෙවීම සුදුසුයි කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

මේ පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදි.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතුව සිටියදී 2022.02.01 දින හදිසි අනතුරකින් මිය ගිය එච්.පී.නිශාන්ත ගුණවර්ධන මහතාට, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 176 වන උප වගන්තිය අනුව රු:300,000.00ක පාරිතෝෂික දීමනාවක්, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.04) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් උඩවලව සතිපොලෙහි 2021 වර්ෂයේ ජුනි මස සිට දෙසැම්බර් දක්වා හිඟ විදුලි හා ජල බිල්පත් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් උඩවලව සතිපොලෙහි 2021 වර්ෂයේ ජුනි මස සිට දෙසැම්බර් දක්වා රු:6,000.00ක් වූ විදුලි බිල්පත හා රු:6,500.00ක් වූ ජල බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් උඩවලව සතිපොලෙහි 2021 වර්ෂයේ ජුනි මස සිට දෙසැම්බර් දක්වා රු:6,000.00 ක් වූ විදුලි බිල්පත හා රු:6,500.00 වූ ජල බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.05) කොරෝනා වෛරස් ව්‍යාප්තිය හේතුවෙන් 2021 වර්ෂයේ අප්‍රේල් මස සිට 2021 සැප්තැම්බර් මාසය දක්වා ව්‍යාපාරික ස්ථාන වසා තිබූ බැවින් එම ව්‍යාපාරික ස්ථානවලට අදාල,**

- **රු:287,000.00ක් වන බලපත්‍ර ගාස්තු**
- **රු:802,510.00ක ව්‍යාපාර හා කර්මාන්ත බදු**

**ලේඛණවලින් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
කොරෝනා වෛරස් ව්‍යාප්තිය හේතුවෙන් 2021 වර්ෂයේ අප්‍රේල් මස සිට 2021 සැප්තැම්බර් මාසය දක්වා ව්‍යාපාරික ස්ථාන වසා තිබූ බැවින් එම ව්‍යාපාරික ස්ථානවලට අදාල,

- රු:287,000.00ක් වන බලපත්‍ර ගාස්තු
- රු:802,510.00ක ව්‍යාපාර හා කර්මාන්ත බදු

ලේඛණවලින් කපා හැරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>**
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**
ගරු සභාපතිතුමණි,මාර්තු 31 වෙනකොට මේව අය කරල තියෙන්න ඕන.මාර්තු 31 වෙනකොට ගෙවල ඉවර කරල තියෙන්න ඕන නම් අප්‍රේල් වෙනකම් ආවෙ කොහොමද?නීත්‍යානුකූලව නම් 31 වෙනකොට මොවුන් මේ බදු ගෙවල තියෙන්න ඕන.එහෙම ගෙව්ව නම් ඔවුන්ට කියන්න පුළුවන් අප්‍රේල් ඉඳල ව්‍යාපාර ස්ථාන වහපු නිසා ඉතුරු මුදල දෙන්න කියලා.නමුත් ගෙව්වෙවත් නැතුව කොහොමද? කපා හරින්න කියල ඉල්ලන්නේ.මේව අය කර ගත්තේ නැත්තේ ඇයි කියන එකයි ප්‍රශ්නය.මේ කියන කාරණයට අපි එකඟ නැහැ.අය කරගත යුතු මුදලක් අය කර ගත්තේ නැහැ කියන තැන තමයි අපි ඉන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>**
ගරු සභාපතිතුමණි,මම එදත් කිව්වා මේ යෝජනාව අපට නිශ්වය කර ගන්න ඕන කියලා.මොකද සමහර ව්‍යාපාර වහල තිබුණට කර්මාන්ත වැඩ කළා.

මේ පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**
ගරු සභාපතිතුමණි,දැන් ඔබතුමාට පේනව ඇති මොන තරම් සභාවට ලැබිය යුතු ආදායම් ප්‍රමාණයක් අපි අහිමි කර ගන්නවද කියලා.මේ කර්මාන්ත බදු කියල තියෙන අට ලක්ෂ ගානම අය කරගත්ත පුළුවන් එකක්.මේක කපා හැරිය නම් බරපතල අපරාධයක්.ඒ නිසා මම යෝජනා කරනවා, මේ බලපත්‍ර ගාස්තු දැන් අය කරල දාන්න ආදායම් ශීර්ෂයක් නැති නිසා ඒක කපා හරින්න.ව්‍යාපාර බදු කපා නොහැර සියල්ල අය කරගන්න කියලා.දැනටම එක් ලක්ෂ ගාණක් හොයල තියෙනවා.ආදායම් පරීක්ෂක තුමිය පොරොන්දු වුණා මේ මුදල අය කරල දෙන්නම් කියලා.ඒ නිසා ඒ ටික අය කරගන්න.

- **ඒ අනුව, කොරෝනා වෛරස් ව්‍යාප්තිය හේතුවෙන් 2021 වර්ෂයේ අප්‍රේල් මස සිට 2021 සැප්තැම්බර් මාසය දක්වා ව්‍යාපාරික ස්ථාන වසා තිබූ බැවින් එම ව්‍යාපාරික ස්ථානවලට අදාල,**
- **රු:287,000.00ක් වන බලපත්‍ර ගාස්තු ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ලේඛණවලින් කපා හැරීමටත්,**
- **රු:802,510.00ක ව්‍යාපාර හා කර්මාන්ත බදු නැවත අය කිරීමටත්,**

**සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.06) කලගහවෙල ක්‍රීඩාපිටිය මැණුම් කටයුතු කිරීමට අදාල මැණුම් ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**
කලගහවෙල ක්‍රීඩාපිටියේ මැණුම් කටයුතු සිදු කිරීමට අදාල රු:22,000.00ක් වන මැණුම් ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ගරු සභාපතිතුමණි,මේ අර 6660 නඩුව තියෙන ඉඩම වෙන්න ඕන.තීරණ ගැනීමේදී නඩු නියෝග ගැනත් සැලකිලිමත් වෙන්න.ගමේ මිනිස්සු ක්‍රීඩාංගණය ඉල්ලනවා.හැබැයි එතන අයිතිකාරයෝ දෙන්නෙක් ඉන්නවා.ඒ නිසා හරියටම නිරවුල් කරල කරන්න.අධිකරණ නියෝගත් එක්ක යන්න.ගමේ මිනිස්සු නම් ඉඩම ගන්න කැමතියි.ඒ දවස්වල අපට වාසියට තිබුණ නඩුවක් තමයි අනිත් පැත්තට ගියේ.මොකද නඩුවට නිලධාරියෙක් ගියේ නැහැ. අධිකරණ තීන්දුවක් තියෙන නිසා ඒව හොඳට අධ්‍යයනය කරන්න.ඇත්තටම දැන් ඒ මිනිස්සුන්ගෙන් බලෙන් ගන්න බැහැ.ක්‍රීඩාංගණයකට ගැලපෙන්නේ නැති වල වගේ කොටසක් තමයි දැන් ලැබිල තියෙන්නේ.අපට දැවැන්ත පාඩුවක්.මැණුම් නියෝග හරියටම බලල සභාවට පවර ගන්න පුළුවන් ටික පවර ගන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සාගරිකා පුෂ්ප කුමාරි මිය</u>**

ගරු සභාපතිතුමණි,දැන් ක්‍රීඩාපිටියක් විදියට භාවිත කරන්න බැරි කොටසක් තමයි අපට ලැබිල තියෙන්නේ.මැණුම් කටයුතු නොකරපුම ඉඩමකුත් සම්බන්ධ කරල තමයි අපට අක්කරයක් වෙන් කරල තියෙන්නේ.අර ඉඩමෙන් තමයි අපට අක්කරයක් තියෙන්න ඕන.මේක පොදු ඉඩමක්.තනිකරම බෑවුමක් තියෙන්නේ.ඒ කොටස ක්‍රීඩිපිටියකට ගන්න බැහැ.ඒ නිසා මේ සම්බන්ධව මැදිහත්වීමක් කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

ගරු සභාපතිතුමණි,දැන් මනම්පේරි මහත්තයා දාල මැණුම් කටයුතු කරල ඉවරයිනේ.ඒක කොහොමත් ගෙවන්න වෙනවා.ඒකට කමක් නැහැ.කලබල වෙන්නේ නැතුව රජයේ මිණින්දෝරුවෙක් දාල ඉඩම මන්නවන්න.එතකොට ඒගොල්ලෝ මුලින්ම මණින්නේ පෞද්ගලික ඉඩම.පෞද්ගලික මිණින්දෝරුවා මනින්නේ පෙන්වන සීමාව විතරයි.එයා ගැටුමකට මැදිහත් වෙන්න කැමති නැහැ.රජයේ මිණින්දෝරුවා එහෙම නැහැ.අවශේෂ ඉඩම් මැනලා තමයි පොදු ඉඩම මනින්න ගන්නේ.වැඩිපුර භුක්ති විඳින ටිකක් තියෙනව නම් ඒ ටික නැවත පවර ගන්නවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>**

ගරු සභාපතිතුමණි,මෙතන ඇත්තම කතාව මෙහෙමයි.මනින්න සභයට හිටපු මනුස්සයත් ඉන්නවා ඒ ගමේම. අක්කර දෙකම මැන්නා ඔය ඉඩම.මැන්නට පස්සෙ මිණින්දෝරු මහත්තයා ගත්තා අරහෙන් සල්ලි.නැවත මෙතැනට එන්නෙම නැතුව ප්ලෑන් එක ඇන්දා අක්කර දෙකට අඩුවෙන්.මැණුමේදි ගමේ මිනිස්සුන්ටත් පෙන්නුවා මේ තමයි ක්‍රීඩාපිටිය කියලා.ඇඳපු පිඹුර වෙනස් කරල තමයි අක්කර දෙක අරයට දුන්නේ.ඒක කෙලින්ම සල්ලි අරගෙන කරල තියෙන්නේ.ඒකට සාක්ෂිත් තියෙනවා. LRC එකෙන් එන්න කිව්වම ඔප්පුව දෙන්න මමයි කොලඹ ගියේ.ඒ වෙලාවෙ ලියපු ඔප්පුව මේසෙ උඩ තියාගෙන තමයි නොදී හිටියේ.දුරකථන අමතුමක් ආවා.ඊට පස්සේ තමයි මේකෙ ප්‍රශ්නයක් තියෙනවා කියලා නොදී හිටියේ.මම නම් කියන්නේ රජයේ මිණින්දෝරුවෙක් දාල ඉඩම මනින්න.

- **ඒ අනුව, කලගහවෙල ක්‍රීඩාපිටියේ මැණුම් කටයුතු සිදු කිරීමට අදාල රු:22,000.00ක් වන මැණුම් ගාස්තු ගෙවීමටත්,මෙම ඉඩම නැවත රජයේ මිණින්දෝරුවරයෙකු ලවා මැණුම් කටයුතු සිදු කිරීමටත්, සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.07) 2022 ජනවාරි මස 1,000,000.00 ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

2022 ජනවාරි මස මෙම සභාවේ ලක්ෂ 10ට වැඩි වියදම් 01ක් සිදු කරල තියෙනවා. එය විස්තර සහිතව පහතින් දක්වනවා. ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

| අනු අංකය | දිනය | වවුචර් අංකය | චෙක්පත් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | මුදල රු: |
|---|---|---|---|---|---|---|

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01 | 2022.01.24 | 87 | 787668 සිට 787682 දක්වා | වැටුප් | කාර්ය මණ්ඩල වැටුප් (ස්ථිර) | 3454084.25 |
| එකතුව | | | | | | **3,454,084.25** |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සාගරිකා පුෂ්ප කුමාරි මිය</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස රු:3,454,084.25ක් වූ ලක්ෂ 10ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.08) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද දෙමටගල පරංගියාය නම් ඉඩමෙහි කැබලි අංක 04හි කොටසක් භුක්ති විඳිනු ලබන බාහිර පාර්ශවය විසින් තමන් විසින් භුක්ති විඳිනු ලබන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටස තමන් වෙත ලබාදී ඒ වෙනුවෙන් එම ඉඩමේම කැබලි අංක 01 ට යාබදව ඇති ඔවුන්ගේ ඉඩමෙන් කොටසක් සභාවට පවර ගන්නා ලෙස කරන ලද ඉල්ලීම පිළිබඳව සලකා බලන ලද යෝජනාව, සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව  වෙත උක්ත ඉඩමෙන් කැබලි 06ක් ලැබී තිබෙනවා.මෙම ඉඩමෙහි ප්‍රාදේශීය සභාවට අයත්  කැබලි අංක 10 තුළ බාහිර පාර්ශවයකට අයත් නිවසක කොටසක් සහ ප්‍රවේශ මාර්ගය පිහිටලා තිබෙනවා.මෙම බාහිර පාර්ශවය විසින් තමන් විසින් භුක්ති විඳිනු ලබන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටස තමන් වෙත ලබාදී ඒ වෙනුවෙන් එම ඉඩමේම කැබලි අංක 01 ලෙස සඳහන් ඔවුන්ගේ ඉඩම සභාවට පවර ගන්නා ලෙස කරන ලද ඉල්ලීමට එකඟතාවය 2021.05.18 දින මහ සභාවෙන් ලැබුණා.නමුත් මෙහි සංශෝධනයක් සිදු කිරීමට අවශ්‍යයයි. විෂය නිලධාරී අතින් අතපසුවීමකින් එදා බාහිර පාර්ශවයට අයත් නිවසේ කොටසක් සහ ප්‍රවේශ මාර්ගය පිහිටලා තිබෙන ඉඩමේ කැබලි අංකය, අංක  04 ලෙස තමයි සඳහන්  වෙලා තියෙන්නේ.නමුත් එය කැබලි අංක 10 ලෙස සංශෝධනය විය යුතුයි.මේ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද දෙමටගල පරංගියාය නම් ඉඩමෙහි කැබලි අංක 04හි කොටසක් භුක්ති විඳිනු ලබන බාහිර පාර්ශවය විසින් තමන් විසින් භුක්ති විඳිනු ලබන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටස තමන් වෙත ලබාදී ඒ වෙනුවෙන් එම ඉඩමේම කැබලි අංක 01 ට යාබදව ඇති ඔවුන්ගේ ඉඩමෙන් කොටසක් සභාවට පවර ගන්නා ලෙස කරන ලද ඉල්ලීම පිළිබඳව සලකා බලන ලද යෝජනාව, "ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද දෙමටගල පරංගියාය නම් ඉඩමෙහි කැබලි අංක 10හි කොටසක් භුක්ති විඳිනු ලබන බාහිර පාර්ශවය විසින් තමන් විසින් භුක්ති විඳිනු ලබන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටස තමන් වෙත ලබාදී ඒ වෙනුවෙන් එම ඉඩමේම කැබලි අංක 01 ලෙස සඳහන්ව ඇති ඔවුන්ගේ ඉඩම සභාවට පවර ගන්නා ලෙස කරන ලද ඉල්ලීම පිළිබඳව සලකා බලන ලද යෝජනාව" වශයෙන්ද එහි තීරණය "ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද දෙමටගල පරංගියාය නම් ඉඩමෙහි කැබලි අංක 10හි කොටසක් භුක්ති විඳිනු ලබන බාහිර පාර්ශවය වෙත, ඔවුන් විසින් භුක්ති විඳිනු ලබන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු, එම ඉඩම් කොටස ලබාදී ඒ වෙනුවට පල්ලෙබැද්ද දෙමටගල පරංගියාය නම් ඉඩමේම කැබලි අංක 01 ලෙස සඳහන්ව ඇති බාහිර පාර්ශවයට අයත් ඉඩම සභාවට පවරා ගැනීම සුදුසු බවටත්, එම තීරණය සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් විමර්ශණ වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවටත්, ගරු සභාව විසින්**

**තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය." යනුවෙන් ද සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.09) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු කොළඹගෙආර සතිපොල භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහාත්,ඒ සඳහා සුදුසු මිණින්දෝරුවරයෙකු තෝරා පත්කර ගැනීම සඳහාත්,එම මිණින්දෝරු ගාස්තු ගෙවීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු කොළඹගෙආර සතිපොල භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහාත්,ඒ සඳහා සුදුසු මිණින්දෝරුවරයෙකු තෝරා පත්කර ගැනීම සඳහාත්,ඊට අදාල මිණින්දෝරු ගාස්තු ගෙවීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

කොළඹගෙආර සතිපොල භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහා මනම්පේරි මහතා සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු කොළඹගෙආර සතිපොල භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහාත්, ඒ සඳහා ජී.ඩබ්.කේ.මනම්පේරි මහතා සුදුසු බවටත්, ඊට අදාල මිණින්දෝරු ගාස්තු ගෙවීම සඳහාත්, සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.10) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද දෙමටගල පරංගියාය නම් ඉඩමෙහි මැණුම් කටයුතු කිරීමට අදාල මැණුම් ගාස්තු ගෙවීම අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද දෙමටගල පරංගියාය නම් ඉඩමෙහි මැණුම් කටයුතු සිදු කිරීමට අදාල රු:25,000.00ක් වන මැණුම් ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද දෙමටගල පරංගියාය නම් ඉඩමෙහි මැණුම් කටයුතු සිදු කිරීමට අදාල රු:25,000.00ක් වන මැණුම් ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.11) කාවන්තිස්සපුර මුල්ලගස්යාය මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

කාවන්තිස්සපුර මුල්ලගස්යාය මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, කාවන්තිස්සපුර මුල්ලගස්යාය මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.12) මහපැලැස්ස කොලොන්ගහ හරහා විහාරස්ථානය දක්වා මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
මහපැලැස්ස කොලොන්ගහ හරහා විහාරස්ථානය දක්වා මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, මහපැලැස්ස කොලොන්ගහ හරහා විහාරස්ථානය දක්වා මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.13) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද සතිපොලෙ භූමියෙහි වෙළඳුන් විසින් හානි කරන ලද ස්ථාන අළුත්වැඩියා කිරීම වෙනුවෙන් සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

- **මෙම යෝජනාව ඉවත් කරගන්නා ලදි.**

**05.14) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ පරිගණක යන්ත්‍ර සඳහා නව UPS යන්ත්‍ර 07ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
මෙම ප්‍රාදේශීය සභාවේ පරිගණක යන්ත්‍ර සඳහා නව UPS යන්ත්‍ර 07ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ පරිගණක යන්ත්‍ර සඳහා නව UPS යන්ත්‍ර 07ක් මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.15) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සේවය සඳහා නව සෞඛ්‍ය කම්කරුවන් තිදෙනෙකු අනියම් පදනම මත බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සේවය සඳහා නව සෞඛ්‍ය කම්කරුවන් ලෙස,

01. කටුවේ බැද්ද ගමරාලලාගේ ඉන්දික ජගත් ගමගේ
02. ගරුසිංගේ නිලාන් ප්‍රදීප් කුමාර
03. වීරසිංගේ මහේන්ද්‍ර නාමල්

යන තිදෙනා අනියම් පදනම මත බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සේවය සඳහා නව සෞඛ්‍ය කම්කරුවන් ලෙස,**

**01.** කටුවේ බැද්ද ගමරාලලාගේ ඉන්දික ජගත් ගමගේ **(822461905v)**
**02.** ගරුසිංගේ නිලාන් ප්‍රදීප් කුමාර **(950391090v)**
**03.** වීරසිංගේ මහේන්ද්‍ර නාමල් **(820353056v)**

**යන තිදෙනා අනියම් පදනම මත බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.16) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගෙස්ටෙට්නර් රිකෝ 2501 HP මුද්‍රණ හා ඡායා පිටපත් යන්ත්‍රය අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගෙස්ටෙට්නර් රිකෝ 2501 HP මුද්‍රණ හා ඡායා පිටපත් යන්ත්‍රය අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගෙස්ටෙට්නර් රිකෝ 2501 HP මුද්‍රණ හා ඡායා පිටපත් යන්ත්‍රය අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා විසින් සභාගත කරන ලද යෝජනා.</u>

**05.17) කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,පළමු වන පටුමග ඉතිරි කොටස තාර අතුරා සංවර්ධනය කිරීමට අදාල ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනිමට අදාළ යෝජනාව.**

- **මෙම යෝජනාව ඉදිරි සභා වාරයට කල් තබන ලදි.**

**05.18) තෝරකොලයාය ලලිත් කඩේ අසල සිට හේනවත්ත මාර්ගයේ, යෝජිත ජල ටැංකිය ඉදි කරන ස්ථානය දක්වා මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා</u>
තෝරකොලයාය ලලිත් කඩේ අසල සිට හේනවත්ත මාර්ගයේ, යෝජිත ජල ටැංකිය ඉදි කරන ස්ථානය දක්වා මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, තෝරකොලයාය ලලිත් කඩේ අසල සිට හේනවත්ත මාර්ගයේ, යෝජිත ජල ටැංකිය ඉදි කරන ස්ථානය දක්වා මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.19) කුඹුගොඩආර රථනාරාම විහාරස්ථානය ඉදිරිපිට සමගි මාවත 2Km ක පමණ කොටස සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා</u>
කුඹුගොඩආර රථනාරාම විහාරස්ථානය ඉදිරිපිට සමගි මාවත 2Km ක පමණ කොටස සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, කුඹුගොඩආර රත්නාරාම විහාරස්ථානය ඉදිරිපිට සමගි මාවත 2Km ක පමණ කොටස සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.20) කුඹුගොඩආර වීරසිංහපුර මැද මාවත සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා</u>
කුඹුගොඩආර වීරසිංහපුර මැද මාවත සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, කුඹුගොඩආර වීරසිංහපුර මැද මාවත සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා විසින් සභාගත කරන ලද යෝජනා.</u>

**05.21) උඩවලව රණවිරු මහින්ද මාවත නිහාල් මහතාගේ නිවස මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>
උඩවලව රණවිරු මහින්ද මාවත නිහාල් මහතාගේ නිවස මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, උඩවලව රණවිරු මහින්ද මාවත නිහාල් මහතාගේ නිවස මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.22) මහආර 04 වන පටුමග හා 05 වන පටුමග යා කරන අතුරු මාර්ගය  සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>
මහආර 04 වන පටුමග හා 05 වන පටුමග යා කරන අතුරු මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, මහආර 04 වන පටුමග හා 05 වන පටුමග යා කරන අතුරු මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.23) මහආර 03 වන පටුමගෙහි ධම්මික මහතාගේ නිවස දක්වා අතුරු මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>

මහආර 03 වන පටුමගෙහි ධම්මික මහතාගේ නිවස දක්වා අතුරු මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, මහආර 03 වන පටුමගෙහි ධම්මික මහතාගේ නිවස දක්වා අතුරු මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.24) මහආර අතුරු මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>

මහආර අතුරු මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, මහආර අතුරු මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.25) උඩවලව රණවිරු මහින්ද මාවතෙහි 04 වන පටුමග සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>

උඩවලව රණවිරු මහින්ද මාවතෙහි 04 වන පටුමග සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, උඩවලව රණවිරු මහින්ද මාවතෙහි 04 වන පටුමග සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.26) උඩවලව මංජුලා මාවත කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>

උඩවලව මංජුලා මාවත කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:411,600.00ක ඇස්තමේන්තුව සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, උඩවලව මංජුලා මාවත කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:411,600.00ක ඇස්තමේන්තුව සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ජ්.කාන්තිලතා මහත්මිය විසින් සභාගත කරන ලද යෝජනා.</u>**

**05.27) නො:1547,ජූලංගැටේ,පදලංගල, ලිපිනයේ පදිංචි අඩු ආදායම්ලාභී පුංචි හේවාගේ සෝමසිරි යන අයගේ නිවසේ වහලය සඳහා සෙවිලි තහඩු 20ක් ලබාදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ජ්.කාන්තිලතා මහත්මිය</u>

නො:1547,ජූලංගැටේ,පදලංගල, ලිපිනයේ පදිංචි අඩු ආදායම්ලාභී පුංචි හේවාගේ සෝමසිරි යන අයගේ නිවසේ වහලය සඳහා සෙවිලි තහඩු 20ක් ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, නො:1547,ජූලංගැටේ,පදලංගල, ලිපිනයේ පදිංචි අඩු ආදායම්ලාභී පුංචි හේවාගේ සෝමසිරි යන අයගේ නිවසේ වහලය සඳහා සෙවිලි තහඩු 20ක් ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා විසින් සභාගත කරන ලද යෝජනාව.</u>**

**05.28) තුංකම වැව්සිරිගම චාමර මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා</u>

තුංකම වැව්සිරිගම චාමර මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද රු:1,105,600.00ක ඇස්තමේන්තුව සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, තුංකම වැව්සිරිගම චාමර මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද රු:1,105,600.00ක ඇස්තමේන්තුව සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.** හදිසි යෝජනා

**06.01) පල්ලෙබැද්ද උප කාර්යාලය ඉදිරිපිට සභාව සතු බිම් කොටසෙන් කොටසක් මල්පැල,පළතුරු පැල,මල් බඳුන්,හා අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා මියනකොළදෙනිය,හල්වින්න,ගොඩකවෙල ලිපිනයේ පදිංචි එස්.එච්.චන්දන තිලකරත්න යන අයට මාසික බදු පදනම යටතේ ලබාදීම පිළිබඳවත්, එම බදු මුදල පිළිබඳවත් තීරණයක් ලබා ගැනීමට හා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

පල්ලෙබැද්ද උප කාර්යාලය ඉදිරිපිට සභාව සතු බිම් කොටසෙන්, කොටසක් මල්පැල,පළතුරු පැල,මල් බඳුන්,හා අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ලබාදෙන ලෙස ඉල්ලීමක් කරල මියනකොළදෙනිය,හල්වින්න,ගොඩකවෙල ලිපිනයේ පදිංචි එස්.එච්.චන්දන තිලකරත්න යන අය විසින් ලිපියක් ඉදිරිපත් කරල තියෙනවා.නිකන්ම තිබෙනවාට වඩා ආදායමක් උපයා ගන්න පුළුවන් නම් හොඳයිනෙ.එම නිසා මෙම බිම් කොටස රු:15,000.00ක මාසික බදු පදනම යටතේ ඉහත ඉල්ලීම සිදු කරන ලද පුද්ගලයාට බදුදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජ්.චන්ද්‍රසිරි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

ගරු සභාපතිතුමණි,කිසිඳු ඉදිකිරීමක් නොමැතිව අවමය මාස තුනකට වතාවක්වත් ගිවිසුම අළුත් කිරීමේ පදනම මත දෙනව නම් දෙන්න.ගැටළුවක් තියෙනව නම් දෙන්න එපා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ගරු සභාපතිතුමණි,කලින් ඔය ඉඩම අල්ලගත්ත හදපු කෙනාගෙ නමත් චන්දන. මේ ඔහු නම් ඔය හොඳකට නෙමෙයි සූදානම් වෙන්නේ.හොඳට හොයල බලලා මේ සම්බන්ධව අපි පසුව තීන්දුවක් ගමු.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ගරු මන්ත්‍රීතුමණි,පැහැදිලි ගිවිසුමකින්,නීත්‍යානුකූලව දෙනව නම් ඒක ගැටළුවක් වෙන්නේ නැහැ.කිසිම ඉදි කිරීමක් කරන්න අවසර නොදී ඉමු.එහෙම එකඟ වෙනව නම් පමණක් අවසර දෙමු.

- **ඒ අනුව, කිසිඳු ඉදිකිරීමක් සිදු නොකර ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ වන්නේ නම් පමණක්, රු:15,000.00ක මාසික බදු පදනම යටතේ, පල්ලෙබැද්ද උප කාර්යාලය ඉදිරිපිට සභාව සතු බිම් කොටසෙන් කොටසක් මල්පැල,පළතුරු පැල,මල් බඳුන්,හා අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා මියනකොළදෙනිය,හල්වින්න,ගොඩකවෙල ලිපිනයේ පදිංචි එස්.එච්.චන්දන තිලකරත්න යන අයට ලබාදීමටත්,එහිදී අවම වශයෙත් මාස තුනකට වතාවක් ගිවිසුම් අළුත් කිරීමටත් සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.02) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත දැනට සේවයේ නියුතු,**

- **කඩවතගේ ප්‍රදිප් කුමාර**
- **ගීගන කංකානම්ගේ සමන්ත උදය කුමාර**

**යන දෙදෙනා පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු දෙක සඳහා අනියම් පදනම මත බඳවා ගැනිම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

කඩවතගේ ප්‍රදිප් කුමාර හා ගීගන කංකානම්ගේ සමන්ත උදය කුමාර යන දෙදෙනා දැනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ වසර අටක පමණ කාලයක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතුව ඉන්නවා. අප ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ රියදුරු තනතුරෙහි පුරප්පාඩු නොමැති කමින් මෙම දෙදෙනා මෙච්චර කාලයක් ස්ථිර කර ගැනීමට නොහැකි වුණා. මේ වන විට රියදුරු තනතුරු පුරප්පාඩු දෙකක් පවතින නිසා ඉහත නම් සඳහන් දෙදෙනා එම පුරප්පාඩු දෙක සඳහා අනියම් පදනම මත බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින රියදුරු තනතුර දෙක සඳහා කඩවතගේ ප්‍රදිප් කුමාර සහ ගීගන කංකානම්ගේ සමන්ත උදය කුමාර යන දෙදෙනා අනියම් පදනම මත බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරනු ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.03) මුල්ඇඩියාවල විහාරස්ථානය අළුත්වැඩියා කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මුල්ඇඩියාවල විහාරස්ථායේ අපි මුලින්ම යෝජනාව දැම්මේ වාහල්කඩ සහ යකඩ වැට ඉදි කරන්න.නමුත් සංඝාවාසයේ බිම සිමෙන්ති තට්ටුව තැනින් තැන ගැලවිලා වලවල් හැරිලා තිබෙන නිසා විහාරාධිපති හිමියන්

ඉල්ලීමක් කළා, ඒ බිම ටයිල් අතුරලා දෙන්න කියලා. විහාරාධිපති හිමියන්ගේ ඒ ඉල්ලීම නිසා අපි ඇස්තමේන්තුව අනුමත කර ගත්තේ විහාරස්ථානය අළුත්වැඩියා කරන්න කියලා.දැන් මේ ව්‍යාපෘතියේ වැඩ අවසන් වෙලා තියෙන්නේ.නමුත් යෝජනාවේ සහ ඇස්තමේන්තුවේ පරස්පර භාවයක් තිබෙන නිසා ගෙවීම් කටයුතු කරන්න විදියක් නැහැ.ඒ නිසයි මේ යෝජනාව සහ ඇස්තමේන්තුව නැවත සභාවට ඉදිරිපත් කරන්නේ.ඒ අනුව මුල්ඇඩියාවල විහාරස්ථානය අළුත්වැඩියා කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,471,000.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, මුල්ඇඩියාවල විහාරස්ථානය අළුත්වැඩියා කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,471,000.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06.04) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 ටිපර් රථයේ ක්ලච් පොම්පය යොදා, රිලේ යොදා,වයිපර් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මෙම ප්‍රාදේශීය සභාව සතු LL 6987 ටිපර් රථයේ ක්ලච් පොම්පය යොදා, රිලේ යොදා,වයිපර් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 ටිපර් රථයේ ක්ලච් පොම්පය යොදා, රිලේ යොදා,වයිපර් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06.05) මහයාය විහාරස්ථාන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාල බිල්පත ගෙවීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ජඳුර මහයාය විහාරස්ථාන මාර්ගය මුලින්ම අපි යෝජනා අනුමත කර ගත්තේ තාර අතුරා සංවර්ධනය කරන්න.නමුත් දැඩි ලෙස බෑවුම සහිත සෝදා පාළුවට ලක්වෙන මාර්ගයක් නිසා කාර්මික නිලධාරීතුමා නිර්දේශ කළේ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කරන්න.ඒ නිසා මේ මාර්ගයට කොන්ක්‍රීට් අතුරන්න ඇස්තමේන්තු අනුමත කරගත්තා.නමුත් අතපසුවීමකින් කොන්ක්‍රීට් අතුරන්න යෝජනාව සම්මත කරගන්න බැරිවෙලා.දැන් මේ ව්‍යාපෘතියෙ වැඩ අවසන් වෙලා තියෙන්නේ.එම නිසා මහයාය විහාරස්ථාන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාල රු:1,390,813.43ක් වන බිල්පත ගෙවීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, මහයාය විහාරස්ථාන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාල රු:1,390,813.43ක් වන බිල්පත ගෙවීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩී.එච්.සීතා පද්මිණී මහත්මිය විසින් සභා ගත කරන ලද යෝජනාව.</u>

**06.06) සංබපාල වසමට අයත් වැල්ලැව ගල්බොක්කයාය මාර්ගයේ 2Km පමණ වූ කොටස සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩී.එච්.සීතා පද්මිණී මහත්මිය**</u>

සංබපාල වසමට අයත් වැල්ලැව ගල්බොක්කයාය ගම්මානයේ වැඩි පිරිසක් ගොවිතැනින් තමයි ජීවත් වෙන්නේ. මෙම ගම්මානය කුරුඳු, ගම්මිරිස් වැනි අපනයන බෝග පවා වගා කිරීමට සුදුසු ප්‍රදේශයක්. නමුත් තම ගොවි බිම් වෙත යාමටත්,එම ගොවි බිම්වල අස්වැන්න නැවත ගම්මානය කරා ප්‍රවාහනය කිරීමටත් නිසියාකාර මාර්ගයක් නොමැතිකමින් ගොවි ජනතාව දැන් වගා කටයුතු නතර කරලා තියෙන්නේ.2Km ක් පමණ දුරටවත් මෙම මාර්ගය සකස් කරල දෙන්න කියල මේ ප්‍රදේශයේ ජනතාව මගෙන් ඉල්ලීමක් කළා. මේ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, සංබපාල වසමට අයත් වැල්ලැව ගල්බොක්කයාය මාර්ගයේ 2Kmක පමණ කොටස සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය විසින් සභා ගත කරන ලද යෝජනාව.**</u>

**06.07) ජුලංගැටය ග්‍රාමසේවා වසමේ පිහිටි ජුලංගැටය පොදු සුසාන භූමිය වටා කම්බි වැට ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය**</u>

ජුලංගැටය ග්‍රාමසේවා වසමේ පිහිටි ජුලංගැටය පොදු සුසාන භූමියේ මැණුම් කටයුතු මේ වෙන කොට ඉවර වෙලා තියෙන්නේ. ඒ වටා කම්බි වැට ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ජුලංගැටය ග්‍රාමසේවා වසමේ පිහිටි ජුලංගැටය පොදු සුසාන භූමිය වටා කම්බි වැට ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>**ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා විසින් සභා ගත කරන ලද යෝජනා.**</u>

**06.08) සුදුගල ග්‍රාමසේවා වසමට අයත් දඩුහැතැක්ම ගම්මානයේ පිහිටා ඇති ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු භූමිය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා**</u>

සුදුගල ග්‍රාමසේවා වසමට අයත් දඩුහැතැක්ම ගම්මානයේ පිහිටා ඇති ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු භූමිය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සාගරිකා පුෂ්ප කුමාරි මිය**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, සුදුගල ග්‍රාමසේවා වසමට අයත් දඩුහැතැක්ම ගම්මානයේ පිහිටා ඇති ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු භූමිය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.09) සුදුගල ග්‍රාමසේවා වසමට අයත් දඩුහැතැක්ම සිට  මැගිලියගස්කඩ හරහා ආරච්චිකන්ද මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

සුදුගල ග්‍රාමසේවා වසමට අයත් දඩුහැතැක්ම සිට  මැගිලියගස්කඩ හරහා ආරච්චිකන්ද මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය **ලබාදීම** සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව,  සුදුගල ග්‍රාමසේවා වසමට අයත් දඩුහැතැක්ම සිට  මැගිලියගස්කඩ හරහා ආරච්චිකන්ද මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක්  නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.10) සුදුගල දඩුහැතැක්ම ප්‍රජා ශාලාව ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යාධාර (කොන්ක්‍රීට් කණු ඇතුළු) ලබාදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

සුදුගල දඩුහැතැක්ම ප්‍රජා ශාලාව සමෘද්ධි සමිතිය මගින් ගම්වාසීන්ගේද ශ්‍රම දායකත්වය යටතේ දැනට ඉදි කරමින් පවතිනවා. මේ සඳහා අවශ්‍ය කොන්ක්‍රීට් කණු හා ඉදිකිරීම් ද්‍රව්‍ය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, සුදුගල දඩුහැතැක්ම ප්‍රජා ශාලාව ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යාධාර (කොන්ක්‍රීට් කණු ඇතුළු) ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක්  නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා විසින් සභා ගත කරන ලද යෝජනා.**</u>

**06.11) කොළඹගෙආර මවුන්ට් පාක් හෝටලය පිටුපස මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

මාගේ කොට්ඨාශයට අයත් කොළඹගෙආර මවුන්ට් පාක් හෝටලය පිටුපස මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කොළඹගෙආර මවුන්ට් පාක් හෝටලය පිටුපස මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.12) කොළඹගෙආර විහාරමහා දේවී මාවතේ ආනන්ද මහතාගේ නිවස දක්වා  මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

මාගේ කොට්ඨාශයට අයත් කොළඹගෙආර විහාරමහා දේවී මාවතේ ආනන්ද මහතාගේ නිවස දක්වා මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා **අනුමැතිය ලබාදීම** සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කොළඹගෙආර විහාරමහා දේවී මාවතේ ආනන්ද මහතාගේ නිවස දක්වා මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී අශානි ප්‍රියංගිකා මහත්මිය විසින් සභාගත කරන ලද යෝජනාව.**</u>

**06.13) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී මණ්ඩලය සඳහා මුඛ ආවරණ හා විෂබීජ නාශක සේදුම් දියර මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී අශානි ප්‍රියංගිකා මහත්මිය</u>

කොරෝනා වෛරස් වසංගත තත්ත්වය තව දුරටත් උග්‍ර වෙමින් පවතින බැවින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සියළුම මන්ත්‍රී මණ්ඩලය සඳහා මුඛ ආවරණ හා විෂබීජ නාශක සේදුම් දියර මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සීතා පද්මිණී මහත්මිය</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී මණ්ඩලය සඳහා මුඛ ආවරණ හා විෂබීජ නාශක සේදුම් දියර මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා විසින් සභාගත කරන ලද යෝජනාව.**</u>

**06.14) හිඟුර කොට්ඨාශයට අයත් තෝරගල 66 මාර්ගයේ පළමු වන පටුමග සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>

මාගේ කොට්ඨාශයට අයත් තෝරගල 66 මාර්ගයේ පළමු වන පටුමග සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි මහත්මිය</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, හිඟුර කොට්ඨාශයට අයත් තෝරගල 66 මාර්ගයේ පළමු වන පටුමග සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා විසින් සභාගත කරන ලද යෝජනාව.**</u>

**06.15) කරවිලයාය හිරිගල්කටුව මාර්ගයේ පිහිටා ඇති බෝක්කුව පිළිසකර කිරීමට හෝ අළුතින් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා</u>

තුංකම කොට්ඨාශයට අයත් කරවිලයාය හිරිගල්කටුව මාර්ගය මේ වන විට අබලන් තත්වයේ තමයි තියෙන්නේ.මෙම මාර්ගයට ඇති එකම බෝක්කුවත් මේ වන විට ගිලා බැසීමට ලක්වෙලා තියෙන්නේ.සම්පූර්ණ මාර්ගයම සංවර්ධනය කරන්න මේ අවස්ථාවේ ප්‍රතිපාදන නැති නිසා මම යෝජනා කරනවා, කරවිලයාය හිරිගල්කටුව මාර්ගයේ පිහිටා ඇති බෝක්කුව පිළිසකර කිරීමට හෝ අළුතින් ඉදිකිරීම සුදුසු බවට.මේ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කරවිලයාය හිරිගල්කටුව මාර්ගයේ පිහිටා ඇති බෝක්කුව පිළිසකර කිරීමට හෝ අළුතින් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**07.කාරක සභා වාර්තා සලකා බැලීම.**

- **2022.01.31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022.01.31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

2022.01.31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීම සුදුසු බවට මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව 2022.01.31 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**08.මාසික ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.**

I. **2022 ජනවාරි මස ලැබීම් සාරාංශය.**
II. **2022 ජනවාරි මස ගෙවීම් සාරාංශය.**
III. **2022.01.31 දිනට අදායම් එකතු කිරීමේ ප්‍රගති වාර්තා.**
IV. **2022 ජනවාරි මස ලක්ෂ 10ට වැඩි වියදම්.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022 ජනවාරි මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 ජනවාරි මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**09.වෙනත් කරුණු**

**නැත.**

- **ගරු සභාපති තුමාගේ ස්තුති කථාව.**

අද දින මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරව පුර්වක ස්තුතිය පුදකර සිටිනවා.

2022.02.17 වන දින පැවති මහ සභාව ප.ව. 1.00ට පමණ නිමාවට පත් විය.

සුරන්ත වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.